# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය SINHALA

India's National Spiritual Newspaper ₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

1969 to 2029 REACHING NATIONS ECHO OF HIS CALL SINCE 1969 DIAMOND JUBILEE

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XX YEAR OF OUR LORD JESUS CHRIST, 2026 MARCH Issue No. 04


## ශුද්ධවූ බයිබලය

### (ගීතාවලිය 4:1-8)

01. මාගේ ධර්මිෂ්ඨකමේ දෙවියන්වහන්ස, මා හඬගසන කල මට උත්තර දුන මැනව, විපත්තියේදී ඔබ මා මිදූසේක. මට කරුණාකොට මාගේ යාච්ඤාව ඇසුව මැනව.

02. මනුෂ්‍ය පුත්‍රයෙනි, මාගේ ගෞරවය කොපමණ කල් අගෞරවයට පෙරළන්නහුද? ඔබ සෑම කොපමණ කල් නිෂ්ඵල දේට ඇලුම්ව බොරුව සොයන්නහුද?

03. නුමුත් ස්වාමීන්වහන්සේ භක්තිවන්තයා තමන්ටම වෙන්කරගත් බව දැනගනිව්. ස්වාමීන්ට මා හඬගසන කල උන්වහන්සේ අසනසේක.

04. භයින් සිටිව්, පව් නොකරව්. යහනේදී ඔබ සෑමගේ ම සිතින් විමසා නිශ්චලවව්.

05. ධර්මිෂ්ඨකමේ පූජා පුදමින්, ස්වාමීන් කෙරෙහි විශ්වාසය තබව්.

06. අපට යහපතක් දක්වන්නේ කවරෙක්දැයි බොහෝ දෙන කියති. ස්වාමීනි, ඔබගේ මුහුණේ එළිය අප කෙරෙහි බැබළෙව්ව මැනව.

07. ඔවුන්ගේ ධාන්‍ය හා මිදිපානය වැඩිවූ කල්හි ඔවුන්ට ඇති ප්‍රීතියට වඩා ඔබ මාගේ සිතේ ප්‍රීතියක් දුන්සේක.

08. මම සමාදානයෙන් වැතිර නිදන්නෙමි. මක්නිසාද ස්වාමීනි, ඔබ මා උදෙක්ම සුවසේ වාසයකරවනසේක.

## දේව අභිමුඛත්වය තුළ ඔබට ආශීර්වාදයත් සමාදානයක් තිබේ !

YOU WILL HAVE BLESSED PEACE IN GOD'S PRESENCE!

*Sis. Angeline*



කැඳවීමේ ප්‍රතිරාවය පවුලේ සියලු දෙනාටම යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් සුබ පතමි. ඔබගේ ආත්මය සවලවත් වෙනවාක් මෙන් ඔබගේ ජීවිතයේ සෑම අංශයකම ආශිර්වාද ලබන්න ඕනේ කියා මා ඔබ උදෙසා යාච්ඤා කරමි.

මෙම මාර්තු මාසයේදී අප ජාත්‍යන්තර කාන්තා දිනය සමරන නිසා මෙම සඟරාව කියවන්නා වූ සියලුම කාන්තාවන්ට මාගේ හෘදයන්ගේම සුබ පැතුම් හා ආසිරි පතන්නෙමි. ඔබ සෑම දෙනාටම ඉතා හොඳ සුවයක් නැවුම් ශක්තියක් සහ දෙවියන්වහන්සේගේ සම්පූර්ණ කරුණාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමි. මේ ලෝකයේ අප ඉතා ප්‍රඥාවන්ත කාන්තාවන් වීමට දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ලැබෙන්නය කියා කියා මා යාච්ඤා කරමි. අපගේ ජීවිතයේ ක්‍රිස්තුස් වහන්සේගේ අලංකාරකම ප්‍රකාශ කරමින් අප ප්‍රඥාවන්ත ලෙස ගමන් කරමු.

දෙවියන්වහන්සේ අපගේ ජීවිතයට සූදානම් කර තිබෙන්නේ විශේෂයේ දීමනාවයි!

කාන්තාවන්ගේ ඇදහිය නොහැකි විවිධ සේවාවන් ගැන සිතන විට මට මගේ මවත් ආච්චිත් මතක් වෙයි. මන්ද ඔවුන් දෙදෙනාම ඉතා වෙහෙස මහන්සි වී කිසිම උදව් උපකාරයක් නොමැතිව ඔවුන්ගේ පවුල් වෙනුවෙන්, මගේ පියාගේ සේවය උදෙසාත් ඉතාම කැපවීමක් කළ ක්‍රියාවන් මගේ ජීවිතයට මහත්

3 වෙනි පිටුවට ...


Echo of His Call



Christian YouTube Channel!

Every day 2 minutes message by

Pr. S. Sam Selva Raj!

in English, Hindi, Tamil & Telugu

and

Tamil & English Message & Prayer

Sunday 8.30 A.M. & 6.00 P.M.

★ Please Subscribe and Share ★

# ECHO OF HIS CALL - (Marching towards 60th year)

Estd. 1969

1969 to 2029 ECHO OF HIS CALL



## from your dearly beloved brother...



### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


**HON. EDITOR-IN-CHIEF**

Rev. Dr. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.

**EX MANAGING EDITOR**

Pastor Alex Samson Sam, B.Th., M.Div.

**GENERAL MANAGER**

Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.

**ADMINISTRATION**

Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech, M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)

**EDITORIAL BOARD**

Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.



**EDITOR, PUBLISHER & PRINTER**

Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858
95661 31858

**E.MAIL**

sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**

www.echoofhiscall.org
www.stpaulsmatriculation.org

**YOUTUBE CHANNEL**

Echo of His Call


"සත්‍යකමත් අවංක කමත් මා රකිවා, මක්නිසාද ඔබ කෙරෙහි බලා සිටිමි." - (ගීතාවලිය 25:21)

දෙවියන්වහන්සේගේ කරුණාවෙන් 2026 වර්ෂයේ මාර්තු මාසයටද ඇතුලුවීමට අපට උපකාර කර තිබේ. පසුගිය මාස වල බොහෝ අභියෝගයන් තිබුනත් උන්වහන්සේගේ කරුණාව අප සැම දෙනා සමගම තිබූ නිසා උන්වහන්සේට අප ස්තූති වන්ත වෙමු. අපගේ පාසලේ 28 වන වරත් පැවැත්වෙන ක්‍රීඩා උත්සවය 2026 ජනවාරි මස 30 තිස් වන දින පැවැත්වුවෙමු. දෙවියන් වහන්සේ අපගේ පාසලට ආශිර්වාද කර තිබේ. අපට ඉතා කැපවීමෙන් යුත් ගුරු මණ්ඩලයක් දෙවියන් වහන්සේ ලබා දී තිබේ.



*St. Paul's Matriculation School - Sports Day*

Dr. ප්‍රේමචන්ද්‍රන්ත් අපගේ ප්‍රධාන ආරාධිත අමුත්තා විය. එදින මුළු දවස පුරාම බොහෝ ක්‍රීඩා වැඩසටහන් පැවැත්වුවෙමු, බොහෝ දෙමාපියන්ද අප සමග මෙයට සහභාගී වුවෝය. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ තලෙන්ත සහ හැකියාවන් එළිදැක්වීමට ද මෙය ඉතා හොඳ අවස්ථාවක් විය.

දැන් අපගේ ශිෂ්‍යයින් අප්‍රේල් මාසයේදී පැවැත්වීමට නියමිතව තිබෙන රජයේ විභාගයට සූදානම් වෙමින් සිටිති. ඔබ සැමදෙනාගේම යාච්ඤාව මේ පාසලටත් ගුරු මණ්ඩලයටත් ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වන ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලටත් ලබා දෙයි කියා අප විශ්වාස කරමු.

'යෝෂුවා විරයින්' යන තේමාව යටතේ අප සභාවේ සිටින පුරුෂයින්හට ජනවාරි මස 2වන දින උදෑසන 9.00 සිට සවස 5.00 දක්වා විශේෂ වැඩසටහනක් පැවැත්වූ වෙමු.

මෙහිදී බොහෝ අයට දෙවියන්වහන්සේ අත ගැසුණේය. ඉගැන්වීමටත් සුභාරංචිය ප්‍රකාශ කිරීමටත් දෙවියන් වහන්සේ අපට බොහෝ සම්පත් තිබෙන අයව ලබා දෙමින් ආශිර්වාද කළෝය.

අප ඉතා ඉක්මනින්ම පවුල් කඳවුරක් පැවැත්වීමට සූදානම් වෙමු. කරුණාකර මේ ගැන අප උදෙසා යාඥා කරන්න

අපගේ අනෙකුත් සේවාවන් දෙවියන් වහන්සේ අපගේ සියළුම සේවාවන් වලටත් නෙහෙමියා බයිබල් විද්‍යාලටත් මාස් පතා නිකුත් කරනු ලබන සඟරාවටත් ඉතා බලවත් ලෙස ආශිර්වාද කරමින් සිටියි.



*Our main Church Men's Retreat – Joshua Warriors Team*


**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ▫ BIBLECOR - Postal Courses (3 languages) ▫ YouTube Ministry ▫ Online Courses ▫ Theological Correspondence Courses (2 languages) ▫ Church Planting ▫ Nehemiah Bible Colleges ▫ Gospel Printing Press ▫ Great Commission Partners ▫ St. Paul's Matriculation School ▫ Crusades ▫ Community Development

2026 වන වසරේ ජූලි මස 4වන දින අපගේ නෙහෙමියා බයිබල් විද්‍යාලෙහි උපාධි ප්‍රධානෝත්සවය පවත්වමු. ඊළඟ වසර සඳහා ජූනි මාසයේදී අප අළුත් ශිෂ්‍යයින් කණ්ඩායමක් ද බඳවා ගන්නෙමු. දෙවියන් වහන්සේට කැප වූ දේවදාසීන් අප වෙත එවන්න කියා යාච්ඤා කරන්න. තවද අප විසින්:

**දේව ධර්ම ඩිප්ලෝමාව (Dip.Th.) /දේව ධර්ම උපාධිය (B.Th.)**

අප මෙම වැඩසටහන් දෙමළ, ඉංග්‍රීසි හා හිංදි භාෂාවන් වලින් පවත්වමු. එසේම බයිබල් විද්‍යාලේ ගුරු මණ්ඩලය නිසාත් යාච්ඤා කරන්න. අපගේ ධර්මදූත සේවයෙහි යෙදී සිටින දේවදාසීන් නිසාත් අනෙකුත් සියලුම දෙපාර්තමේන්තු කටයුතු නිසාත් යාච්ඤා කරන්න. අප ඔබ උදෙසාත් දිගටම යාච්ඤා කරන්නෙමු. එලෙසම ඔබගේ යාච්ඤාව හා උපකාරය අපගේ මෙම සේවාවන් සඳහා ලබා දෙන්නය කියා ඉතා ආදරයෙන් ඉල්ලා සිටිමු. ස්වාමීන්වහන්සේගේ කරුණාව ඔබ හා සමග පවතීවා.

*In Christ Jesus, your servant,* ***Pr. S. Sam Selva Raj***

E.mail : sam@echoofhiscall.org

*1 පිටුවෙන්....*

අභියෝගයක් විය. එසේම මෙම කාර්ය බහුලත්වයෙන් සිටින විට විවේකය කොතරම් අවශ්‍යයද කියා සිතුවෙමි.

මා කාන්තාවන්ට පමණක් නොව විවේකයක් නොමැතිව බොහෝ කාර්යබහුලව සිටින පුරුෂයින්ටද කතා කිරීමට කැමැත්තෙමි. පුරුෂයින් තම පවුල උදෙසා විවේකයක් නොමැතිව බොහෝ වෙහෙස මහන්සි වී වැඩ කරයි. අද ලෝකේ තිබෙන සුඛෝපභෝගී ජීවිත ගත කිරීම පිණිස සටන් කරයි. අපගේ දරුවන් පවා ඒ උදෙසා සටන් කරයි. එනිසා ඔවුන් විවේකයක් නොමැතිව පාසලේ වැඩ අමතර පන්ති යනාදී කාරණා නිසා බොහෝ වෙහෙස මහන්සි වෙයි.

දෙවියන්වහන්සේගේ වචනය ඉතාම බලවත් සත්‍යතාවයක් මේ පිළිබඳව සඳහන් කරයි. ලෝකය මැවීම සඳහා දින 6ක් ගත වූ පසු 7වන දින දෙවියන් වහන්සේ විවේකයක් ගත්තේය. *(උත්පත්ති 2:2)* ලෝකෙ මැවූ දෙවියන් වහන්සේ නිවාඩු ගැනීමට තීරණය කළා නම් අපට විවේකය කොපමණ අවශ්‍යද? නමුත් තවමත් අප බොහෝ දෙනා සිතන්නේ: අපගේ වැඩ කටයුතු අවසන් කිරීමට දවසේ පැය ගණන අපට මදි බවයි. අපගේ නිවසෙහි, රැකියා කරන ස්ථානයෙහි සහ සේවයේදී අප නිවාඩුවක් ගැනීමට තරම් කාලය මදි කියා පවසන්නෙමු. තවත් සමහරු පවසන්නේ දෙවියන්වහන්සේට නිවාඩුවක් ගැනීමට ලේසියි, මන්ද උන්වහන්සේ දෙවියන් වහන්සේ නිසා, මට නිවාඩු ගැනීමට බැහැ මගේ වැඩ ඉවර වෙන්නේ නැති නිසා. මිනුෂ්‍ය ජීවිතයට නිවාඩු අවශ්‍ය බව දෙවියන් වහන්සේ මුලින්ම පුදාහම් කර තමාරයි.

නමුත් අද අපි මේ සැලසුමට පිටුපා නිදි මරාගෙන, හැම නොමැතිව ජීවිතේ තිබෙන අභියෝග වලට මුහුණ දීම සඳහා සටන් කරමින් ඉතා වෙහෙස මහන්සියට පත්ව සිටිමු. නමුත් දෙවියන් වහන්සේගේ වචනයෙන් උන්වහන්සේ අපට කතා කරන්නේ දේව අභිමුඛත්වයෙහි නිවාඩුවක් ගන්න ලෙසයි. නිවාඩු ගැනීම අලසකමක් නොවෙයි. එය කීකරුවීමයි. අප දෙවියන්වහන්සේව විශ්වාස කරමින් පැවසිය යුත්තේ;

"ස්වාමීනි මා ඔබව විශ්වාස කරමි. ඔබ සැම දේම පාලනය කරනවා මා නතර වුවත් ඔබගේ ක්‍රියාව ඔබ ඉදිරියට ගෙනයන බව මා විශ්වාස කරමි " යනුවෙනි.

දේව වචනය තුළ අප ගත යුතු නිවාඩු මොනවාද කියා බලමු. දේව වචනය තුළින් අපට උගන්වන්නා වූ නිවාඩුව කුමක්ද කියා සොයා බලමින් දේව අභිමුඛත්වයේ තුළ අපි සැම දේම අලුත් කර ගනිමු.

සැබෑම සහනය සහ නිවාඩුව අපගේ ආත්මයට ලබාගත හැක්කේ දෙවියන් වහන්සේ තුළින්ම පමණයි. (මතෙව් 11:28)

## විවේක ගැනීමේ බලය

### 1). විවේකය අපගේ ජීවිතය සඳහා දෙවියන් වහන්සේගේ රීද්මයයි!

"දෙවියන්වහන්සේ තමන් විසින් කළ ස්වකීය කර්මාන්තය සත්වෙනි දවසේ නිම කළසේක. උන්වහන්සේ තමන් විසින් කරනලද සියවැඩවලින් සත්වෙනි දවසේ නිවාඩු ගත්සේක. දෙවියන් වහන්සේ තමන් මැවුවාවූ සෑදුවාවූ ස්වකීය සියලු වැඩ වලින් සත්වෙනි දවසේ නිවාඩු ගත් හෙයින් ඒ දවසට ආශීර්වාද කොට එය විශුද්ධයයි නියම කළ සේක." (උත්පත්ති 2:2-3)

දෙවියන් වහන්සේ සබත් දවස අපට දීමනාවක් හැටියට දී තිබේ. විවේකය නොහොත් නිවාඩුව කියා

**Statement about ownership and other particulars about the Newspaper Echo of His Call (Sinhala) - Form 1V**
**(See Rule 8)**

| | |
|---|---|
| 1. Place of Publication | : **New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai - 600 005.** |
| 2. Periodicity | : **Monthly** |
| 3. Printer, Editor, Owner & Publisher | : **S. Sam Selva Raj** (Same Address) |
| 4. Nationality | : **Indian** |

I, **S. Sam Selva Raj** hereby declare that the particulars given above are true to the best of my knowledge and belief.

**March 2026** **S. Sam Selva Raj.**

පවසන්නේ උන්වහන්සේව සොයමින් උන්වහන්සේට ලංවීමට දෙන කාලයයි. උන්වහන්සේගේ වචනය කියවන්න, එය මෙනෙහි කරන්න, යාච්ඤා කරන්න, දේව අභිමුඛත්වය තුළ ප්‍රීති වෙන්න. උන්වහන්සේ තුළින් අප නිවාඩුවක් ගත් විටට අපගේ ශරීරය හා මනස පමණක් නොව අප ආත්මිකවත් නැවුම් භාවයට පත්වෙයි.

අප නිවාඩු ගැනීම අතපසු කළහොත් අප සෑම දේ තුළින්ම කලකිරීමට පත්වීම දැවී යාමට ඉඩ ඇත. දෙවියන්වහන්සේ නිවාඩු ගනු ලැබුවේ උන්වහන්සේ වෙහෙස මහන්සි වූ නිසා නොව දෙවියන්වහන්සේ අපගේ ජීවිතයට ආදර්ශමත් රිද්මයක් දෙන පිණිසයි. නිවාඩු ගැනීම කියා පවසන්නේ; අප කැමතිනම් පමණක් එය කරමු කියා නොව එය දෙවියන් වහන්සේගේ සැලැස්මේ කොටසක්ය කියා සිතමින් එය කළ යුතුය.

## (2). විවේකය යනු සූදානම් වීමකි.

අප විවේක ගැනීම අතපසු කළහොත් අප ඉතා වෙහෙස මහන්සියට පත්වී අපගේ ජීවිතයේ අමාරු ස්ථානයකට පත්වීමට පුළුවනි. යේසුස්වහන්සේගේ ජීවිතය දෙස බලන විට විටදී අපට පෙනෙන්නේ, උන්වහන්සේ තනියම සිටීමට ස්ථානයක් තෝරා ගෙන මනුෂ්‍යයන්ගෙන් වෙන් වී යාඥා කිරීමටත් සේවයේ තිබූ සියලු කාර්ය බහුලත්වයෙන් විවේකයක් ගත් බවත්ය.

''උදය පහන් වෙන්ට බොහෝ ප්‍රථමයෙන් උන්වහන්සේ නැගිට විනාන්තර ස්ථානයකට පිටත්ව ගොස් එහිදී යාඥා කළ සේක." (මතෙව් 1:35)

''නමුත් උන්වහන්සේ විනාන්තර ස්ථානවලට අහක්ව ගොස් යාච්ඤා කළ සේක." (ලූක් 5:16)

යේසුස් වහන්සේ පියාණන් වහන්සේ සමග ගත කළ වේලාව ඉතාමත් අනර්ඝයි. උන්වහන්සේ දෙවියන් වහන්සේ සමග නිතරම සම්බන්ධතාවය පැවැත්වීමෙන් ආත්මික බලය තමා තුළට ගලා එන බව දැනගෙන සිටියේය.

## විවේකය නොසලකා හැරීමෙන් දැවී යාමට හැකිය!

අපගේ ජීවිතයේද විවේකයක් නොමැතිව සිටිනවා නම් අප දැවී යාමට ලක්වෙනු ඇත. අද බොහෝ අය මෙවැනි ප්‍රශ්නවලට මුහුණ දෙනු ලබයි. අප දෙවියන් වහන්සේගේ රිද්මය වන නිවාඩුව අතපසු කළානම්, අප ආත්මික ලෙසත් මාංශික හා හැඟීම්බරවත් දැවී යනු ඇත. දෙවියන්වහන්සේගේ රාජ්‍යය තුළ පවා අපට නිසියාකාර සේවයක් කිරීමට නොහැකි වෙයි.

නිවාඩු ගැනීම ආත්මාර්ථකාමී කමක් නොවෙයි. එය අපගේ ජීවිතයටත් දෙවියන් වහන්සේගේ කැඳවීමත් කෙරෙහි අපට තිබෙන ගබඩාකාරීත්වයයි. දැවීයාම එක් රාත්‍රියකදී සිදු නොවෙයි. නමුත් එය පියවරෙන් පියවර අපේ වෙහෙස මහන්සිය කරණ කොටගෙන අපේ ජීවිත තුළට ඇතුල් වෙයි. දෙවියන්වහන්සේ අපට මේ සඳහා උපකාර කරන්නේ කෙසේද කියා සමහර කරුණු බලමු:

## 1). අස්ථානගත වූ ප්‍රමුඛතා !

දැවීයාම පටන් ගන්නේ අපිට කරන්න පුළුවන් දේට වඩා අප දේවල් කිරීමට යන විටදීය. අප සෑම දේටම 'ඔව්' කියන්නේ අපට සෑමදේම වැදගත් නිසාය. නමුත් අපි ප්‍රඥාවන්ත නම්, ප්‍රමුඛතාවයට පමණක් ඉඩ දිය යුතුයි. අනෙක් දේවලට 'නැත' කියා පැවසිය යුතුයි. මේ සම්බන්ධතාවය ගැන යේසුස් වහන්සේ දැනගෙන සිටියේය.

යේසුස්වහන්සේ වෙතට බොහෝ සෙනග එමින් පැවතුණ නිසා ඔවුන්ට කන්ටවත් වේලාවක් තිබුණේ නැත.

එනිසා උන්වහන්සේ මෙසේ පවසනු ලැබුවේය:

''.......තුඹලා පමණක් විනාන්තර ස්ථානයකට ඇවිත් ටිකක් පහසු ගනිල්ලා යයි ඔවුන්ට කී සේක. මක්නිසාද ඔවුන්ට කෑම කන්ටවත් අවකාශ නැති තරමට එන්නෝ යන්නෝ බොහෝ වූවෝය." (මාර්ක් 6:31)

ලූක් 10 වන පරිච්ඡේදයෙහි යේසුස් වහන්සේ මාර්තා සහ මරියාගේ නිවසට ගියේය කියා අපි කියවමු. මාර්තා යේසුස් වහන්සේවත් උන්වහන්සේ සමග සිටි අයවත් ඉතා ආදරයෙන් පිළිගත්තේය. තවද ඇය මේ අයට සලකන පිණිස ඉතා කාර්යබහුලව සිටියා. අප දෙවියන්වහන්සේ රාජ්‍යය උදෙසා වැඩ කරන්නාවූ අය ගැන ස්තුතිවන්ත වෙමු. නමුත් මාර්තා ඇගේ ප්‍රධාන දේ අතපසු කළාය. මරියා යේසුස් වහන්සේගේ පාමුල වාඩිවී උන්වහන්සේ කියන දේට ඇහුම්කම් දී සිටියාය.

....Contd. to page 6




**ඉතා හදිසි දැනුම් දීමක්!**

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිඳු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: mm@echoofhiscall.org

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**මාර්:19 -** අපගේ යාච්ඤා හවුල්කරුවන් දායක හවුල්කරුවන් ඇදහිල්ලේ හවුල්කරුවන් හා මහා නියෝගයේ හවුල්කරුවන්ට මෙන්ම ඔවුන්ගේ පවුල්වලට දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ලබාදී තිබෙන නිසා, ස්තුති කරන්න.

**මාර්:20-** අපගේ සභාවේ සහ ශාඛා සභාවන්වල සියලු පාලකවරුන් හා සේවක සේවිකාවන්ගේ පවුල්වලට දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ලබා දී තිබෙන නිසා, ස්තුති කරන්න.

**මාර්:21 -** අපගේ සියලුම සහකාර කර්තෘවරුන් සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**මාර්:22-** ගෝලීය වශයෙන් අප පවත්වාගෙන යනු ලබන ළමා සහ තරුණ සේවයට දෙවියන් වහන්සේගේ අනුග්‍රහය ලබාදුන් නිසා ස්තුති කරන්න.

**මාර්:23 -** ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලට දෙවියන් වහන්සේ ආශිර්වාද කර තිබෙන නිසා සහ කැප වූ කිතුණු ගුරුවරුන් සහ විදුහල්පතිවරයෙක් ලබා දී තිබෙන නිසා ස්තුති කරන්න.

**මාර්:24-** අපගේ රාජ්‍ය සම්බන්ධිකාරකවරුන්ට සහ ඔහුගේ පවුල්වලට දෙවියන් වහන්සේ ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**මාර්:25-** විවිධ සේවාවන් හරහා සුභාරංචිය පතුරුවා හැරීමට අපගේ ජ්‍යෙෂ්ඨ දේව ගැතිවරුන්ගේ විශ්වාසවන්ත කැපවීම නිසා ස්තුති කරන්න.

**මාර්:26-** අපගේ ජ්‍යෙෂ්ඨ දේව ගැති එස්. සෑම් සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ අය කෙරෙහි දෙවියන් වහන්සේගේ ආරක්ෂාවත් සෑම නපුරු බලවේගයන්ගෙන් ඔවුන් ආරක්ෂා කර තිබෙන නිසා ස්තුති කරන්න.

**මාර්:27-** අපගේ තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාවට සහ දේව ධර්ම පාඨමාලාවට උන්වහන්සේ ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න

**මාර්:28-** දේශපාලනික හැටුම් හා ආගමික විරුද්ධත්වයන් මධ්‍යයේ අපගේ කිතුණු දේව සේවයන් වර්ධනය කරමින් ශක්තිමත් කර තිබෙන නිසා ස්තුති කරන්න

**මාර්:29 -** කැඳවීමේ ප්‍රතිරාවය පතුරා සේවය සඳහා අපගේ නොනවතින කැපවීමට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලබා දී තිබෙන නිසා ස්තුති කරන්න.

**මාර්:30-** 1969 වන වර්ෂයේ සිට කැඳවීමේ ප්‍රතිරාවය පතුරා සේවයට අප දැක්වූ නොනවතින කැපවීමට දෙවියන් වහන්සේගේ අනුග්‍රහය විශ්වාසවන්තව ලබා දුන් නිසා ස්තුති කරන්න.

**මාර්:31-** ජනවාරි මස 26 වන දින අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල පුරුෂයින් සඳහා මහාබලිපුරම්හි 'යෝෂුවා වොරියර්' නමින් පැවැති පුරුෂයින්ගේ රැස්වීමට දෙවියන් වහන්සේවහන්සේ ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:01-** ශ්‍රී ලංකා දේශයට යහපත් කාලගුණයක් ලබා දී තිබෙන නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:02-** ශ්‍රී ලංකා දේශය තුළ සුභාරංචිය ප්‍රකාශ කිරීමට දෙවියන් වහන්සේ ලබා දී තිබෙන මහත් කරුණාව නිසා සහ කිතුණු සභාවන්ට පැමිණෙන පීඩාවලදී දෙවියන් වහන්සේගේ අනුග්‍රහය ලබාදී තිබෙන නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:03-** ශ්‍රී ලංකා දේශයේ කිතුණු සභාවන් වලට සහ දෙවියන් වහන්සේගේ දරුවන්ට ආත්මික මෙන්ම ලෞකික ආශිර්වාදයන් ලබා දුන් නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**අප්‍රේ:04-** විශේෂයෙන් ලෝකය පුරා පවතින නොසන්සුන්තාවය සහ යුද්ධ බිය මධ්‍යයේ සියලු ජාතීන් කෙරෙහි දිව්‍ය ආරක්ෂාව සාමය සහ ස්ථාවරත්වය ලබා දෙන්නය කියා යාච්ඤා කරන්න.

**අප්‍රේ:05-** සියලු දෙනාටම ආශිර්වාදයක් ලැබෙන පිණිස සහ ඔවුන්ගේ අවශ්‍යතා සපුරා දීමට හැකිවන පිණිස අපගේ දේව සේවයන් හැකි සෑම අයුරින්ම විශාල වී පුළුල්වන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:06-** දෙවියන්වහන්සේගේ රාජ්‍යය පොළොවට මත ගොඩනැගීමට උන්වහන්සේගේ බලවත් වූ දර්ශනයන් ලබා දෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:07-** ලොව පුරා සිටින ජනාධිපතිවරුන් අගමැතිවරුන් සහ සියලුම රාජ්‍ය නිලධාරීන් තම ජාතීන්ට නායකත්වය දෙන විට ඔවුන්ට අවශ්‍ය ප්‍රඥාව හා දිව්‍ය මග පෙන්වීම ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:08-** අපගේ දේව සේවයන් සඳහා යාච්ඤාවෙන් හා මූල්‍යමය දායකත්වය ලබාදෙන ආධාර කරුවන් සුබ පතන්නන් සහ මිතුරන්ට ආශිර්වාදය හා ශක්තිය ලබාදෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:09-** වෛරස් උණ සහ දැන් පවතින නොයෙකුත් බෝවන රෝග වලින් සියලුම ජනතාව ආරක්ෂා කර දෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:10-** 2026 සහ 2027 යන අධ්‍යයන වර්ෂය සඳහා ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලට නවක සිසුන් සාර්ථකව ඇතුළත් කර ගැනීමට හැකිවන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:11 -** ලොව පුරා සිටින තරුණ තරුණියන්ට සහ දරුවන්ට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම පුද්ගලික ගැලවුම්කරු ලෙස පිළිගන්නා පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:12-** අපගේ ප්‍රධාන සභා පාලකය තුමා වන සෑම් සෙල්වරාජ් සහ ඔහුගේ පවුලේ සියලු දෙනාම සියලු නපුරෙන් ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:13 -** 2026 සහ 2027 අධ්‍යයන වර්ෂය සඳහා අපගේ නේවාසිකය හා බයිබල් විද්‍යාල වලට සුදුසුකම් ලත් සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:14-** අපගේ සියලු සේවාවන් සඳහා සෑම අංශයකින්ම අපට උපකාර කරන්නා වූ සියලු දෙනාටම දෙවියන්වහන්සේගේ කරුණාවත් ආශිර්වාදයත් ලබා දෙන්න යාච්ඤා කරන්න.

**අප්‍රේ:15--** ලෝකයේ සිටින්නා වූ සියලුම ජනතාව කෙරෙහි දෙවියන් වහන්සේගේ කරුණාව වගුරුවා ඔවුන්ට සැනසුම හා ශක්තිය ලබා කර දෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:16--** ලෝකයේ සිටින්නා වූ සියලුම ජනතාව කෙරෙහි දෙවියන් වහන්සේගේ කරුණාව වගුරුවා ඔවුන්ට සැනසුම හා ශක්තිය ලබා කර දෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:17--** ශ්‍රී ලංකා දේශය තුළ සුභාරංචිය නොගිය ප්‍රදේශවලට සුබ ආරංචිය ගෙනයන පිණිස දෙවියන් වහන්සේගේ දේව දාස දාසීන් නැගිටුවන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:18--** ශ්‍රී ලංකා දේශය තුළ සිටින්නා වූ කිතුනුවන් වැරදි ඉගැන්වීම් වලින් මුළාව නොයා දේව වචනය තුළ ස්ථිරව පවතින පිණිස හා ඔවුන්ගේ සියලු අවශ්‍යතා සපුරා දෙන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

මාර්තා 'ඔව්' මම මේ වැඩ කරන්නම් කියා භාර ගන්නට ඇත. නමුත් දැන් එය ඇයට කරදරයක් හා බරක් විය. අප අතර සිටින බොහෝ අයත් බොහෝ දේ ඉතා හොඳ අදහසින් 'ඔව්' කියා භාරගන්නා නමුත් කාර්ය බහුලත්වය වැඩි වන විට වෙහෙසට පත් වනු ලබයි.

යේසුස්වහන්සේ මාර්තාවක් හරි ගස්සනු ලැබුවේය:

**''නමුත් ස්වාමීන්වහන්සේ උත්තර දෙමින්: මාර්තා, මාර්තා, තුඹ බොහෝ දේවල් ගැන කලංගුව් කැලඹෙන්නෙහිය. නමුත් ඕනෑකරන්නේ එක දෙයක්ය. මරියා වනාහි ඈ කෙරෙන් බැහැර ගනු නොලබන්නා වූ යහපත් කොටස තෝරා ගත්තා යයි කී සේක." (ලූක් 10:41-42)**

මාර්තාගේ ප්‍රමුඛතාවය අස්ථානගත විය. එහි ප්‍රතිඵලය වූයේ වෙහෙස මහන්සිය පමණක්ය. 2026 වන වර්ෂයේදී අපගේ ප්‍රමුඛතාවය තෝරාගෙන එය අස්ථානගත නොවන ලෙස ක්‍රියා කරමු.

## 2). අනන්‍යතාවය අස්ථානගතවීම !

අප දැවීයාමට ප්‍රධාන හේතුව වන්නේ; අප කුමක්ද කළ යුතුද? අපි කවුද? අප කළ යුතු දේවල් මොනවාද? කියා සිතමින් කැලඹිල්ලට පත්වන නිසාත් අපට වැඩ වැඩි වන විටදී අප තුළ කෝපය ඇතිවෙයි. සමහර විට අප අන් අය හා සමග සංසන්දනය කරමින් අපගේ වැඩ අප තවත් වැඩි කරගනී. නමුත් අපගේ වටිනාකම පැමිණෙන්නේ අප කරන දේවල් අනුව නොව ක්‍රිස්තුස් වහන්සේ කරන කොටගෙනයි.

අපගේ අනන්‍යතාවය පැමිණෙන්නේ අපගේ තත්ත්වය, අපට තිබෙන තනතුරු, ලෝකයේ අපට තිබෙන ස්ථානයන් මත නොව, අපගේ ආනන්‍යතාවය පැමිණෙන්නේ ක්‍රිස්තුස් වහන්සේ තුළින් පමණි.

**''මාගේ දෙවියන්වහන්සේ ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ තමන්ගේ තේජස් සම්පතේ ප්‍රකාරයට තුඹලාගේ සියලු හිඟකම් සම්පූර්ණ කරන සේක." (පිලිප්පි 4:19)**

අප කරන්නා වූ ක්‍රියාවන් ඉතා වැදගත්ය. නමුත් සහාවන් දෙවියන් වහන්සේ සමග තිබෙන සම්බන්ධතාවය නැති කරනොගෙන ක්‍රියාකළ යුතුය. නිතරම දෙවියන් වහන්සේට දීමට කාලයක් වෙන්කර ගන්න.

මෝසෙස් ඉතා අමාරුවෙන් ඔහුගේ ජීවිතයට පාඩමක් ඉගෙන ගත්තේය. ඔහු තනිවම සෑම බරක්ම දරාගෙන ගමන් කරන විටදී ඔහුගේ මාමා වූ යේත්‍රෝ පැමිණ ඔහුගේ වැඩ කටයුතු අන් අය සමග බෙදාගෙන කරන්නේ කෙසේද කියා ඔහුට උපදෙස් ලබා දුන්නේය. (නික්මයාම 18) තවත් අයව සේවය සඳහා පුහුණු කිරීමත් ඔවුන්ට අපගේ වගකීම් බෙදා දීමත් ඉතා වැදගත්ය. දෙවියන්වහන්සේ අපව කැඳවා තිබෙන්නේ සෑම දේම අප විසින්ම කිරීමට නොවේය.

ප්‍රිය මිතුවරුනි, මේ ගමන දිවීමට දෙවියන් වහන්සේගේ කරුණාව අපට දී තිබේ. උන්වහන්සේ පවසන්නේ: අන්තිමය දක්වා ම දිවීම දුවන්න කියාය. ඔබ කිසියම් බරක් දරනවානම්; ''දෙවියන්වහන්සේ මට මෙය කරන්න තිබෙනවාද?" කියා උන්වහන්සේගෙන් අසන්න. අප දැවී යාමට පත්වන්නේ දෙවියන් වහන්සේ අපට දුන් අනවශ්‍ය බරක් අප දරාගෙන යන නිසාය. එසේම සියලුම දේ අප තනියම කරන්නට යන නිසාය.

## 3). අස්ථානගත වූ ප්‍රජාව සහ සම්බන්ධතාවයන් !

දෙවියන්වහන්සේ කිසි විටෙකත් අප තනිවම ජීවත් වන්නට ඕනෑය කියා බලාපොරොත්තු වන්නේ නැත. පටන් ගැන්මේ සිටම දෙවියන් වහන්සේගේ සැලැස්ම වූයේ අප දෙවියන්වහන්සේ සමගත් අන් අය සමගත් සහභාගීකම් පැවැත්විය යුතු බවයි. අපගේ සම්බන්ධතාවයන් කැඩුණු විටදී අප තනිවෙයි. අපගේ ඇතුලාන්තය දුක් වෙමින් සටන්කාමීව ජීවත්වෙයි.

දැවියාමක් සිදුවෙන්නේ අපගේ ජීවිතයේ සම්බන්ධතාවයන් පැවැත්වීමට සුදුසු මිනිසුන්ගෙන් අප ඈත් වන නිසාත් අප නිසි වේලාවන් වලදී නිසි ස්ථානය වල නොසිටින නිසාත්ය.

**''ලොත් ඇස් ඔසවා බලා යොර්දානේ මුලු සමභූමිය හැම තැනම ජල සම්පත්නම තිබෙන බව දුටුවේය. ස්වාමීන් වහන්සේ සොදොම් සහ ගොමෝරා විනාශ කරන්නට පළමුවෙන් එය ශෝවර් දෙසට ස්වාමීන්වහන්සේගේ උයන මෙන්ද මිසර දේශය මෙන්ද වූයේය ." (උත්පත්ති 13:10)** ලොත් සොදොම් සහ ගොමෝරාවේ මිනිසුන්ගේ නපුරු භාවය දැකීමට අසමත් විය. (13 පදය) ඔහු අස්ථානගත වූ සමාජය තෝරා ගත්තේය. එය ඔහුට විනාශය ගෙන දුන්නේය.

ඔබගේ ගමන ඔබ තනිව ගමන් කරන්නට එපා. ඔබගේ සභා පවුලත් සමග සහභාගීකම් පවත්වමින් ජීවත් වෙන්න. අන් අය සමග සම්බන්ධතාවයන් වැඩි කරගන්න. දෙවියන් වහන්සේ සමග කතා කරන්න. අනවශ්‍ය දේ කතා කිරීමෙන් වලකින්න.

දැවී යාම පාපයක්ද?

නැත. එළියා මහත් ජයග්‍රහණයෙන් පසුව කලකිරීමට පත් වී දැවී ගියේය. ඔහු මොරගසමින් පවසනු ලැබුවේ; ස්වාමීන් වහන්ස ඉතින් ඇත කියාය.

**''......ස්වාමීන් වහන්සේ ඉතින් ඇත......."** (1 රාජාවලිය 19:4) දෙවියන්වහන්සේ එළියාව වරදට පත් කළේ නැත. උන්වහන්සේ ඔහුව සනසනු ලැබුවේය. ඔහුට

....Contd. to page 8

## කිතුණුවන් නොමැති නම් - ලොවකුත් නැත.
## නව නිපැයුම් කරුවන්

| | | |
|---|---|---|
| පාපැදිය | - | මැක් මිලන් |
| යතුරු පැදිය | - | ජේ. ඩෙයිලර් |
| ඔටෝ | - | ජොහනතන් ස්කෙඩ්ඩයි |
| කාරය | - | කාර්ල් බෙන්ස් |
| මෝටර් කාරය | - | ඔස්ටින් |
| ජීප් රථය | - | ඩබ්ලිව්.එල්.සෙඩ්සොන් |
| බස් රථය | - | ගෝල්ඩ් වාස්. |
| ගුවන් යානය | - | රයිට් බ්‍රෝස් |
| රේල්ලුව | - | රිචර්ඩ් ට්‍රිවිතික් |
| ට්‍රැක්ටරය | - | ජෝන් ෆ්‍රොක්ලිච් |
| JCB | - | ජෝසප් සී බම්ෆෝඩ් |
| බැටරිය | - | ඒ. වොල්ට් |
| විද්‍යුතය | - | බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් |
| බල්බය | - | තෝමස් ඒ. එඩිසන් |
| ඩයිනමෝව | - | එම්. ෆැරඩේ |
| ගෑස් එන්ජිම | - | ඩේම්ලර් |
| ඩීසල් එන්ජිම | - | ආර්.ඩීසල් |
| වැල්ඩින් | - | එලිහු තොම්සන් |
| දුම්රිය එන්ජිම | - | ස්ටීවන් සහෝදරයෝ |
| LPG ගෑස් | - | ඩොක්ට වෝල්ටර් |
| මයික් ෆෝනය | - | හෙස් ශෝට් |
| පෑන | - | ලොයිස් වෝමන් |
| විදුලි ස්ත්‍රික්කය | - | එච්.ඩබ්ලිව්. සුලි |
| ගිනි පෙට්ටිය | - | ජෝන් වෝල්කර් |
| කැමරාව | - | ජෝන් කාබට් |
| ඩිජිටල් කැමරාව | - | ස්ටීවන් |
| රේසර් | - | කිංග් ජේ. ගිලට් |
| රබර් | - | සී ගුඩ් ඉයර් |
| ශීතකරණය | - | ජේම්ස් හැරිසන්, ඇලෙක්සැන්ඩර් කැට්ලින් |
| සේෆ්ටි පින් | - | වෝල්ටර් හන්ට් |
| මහන මැෂිම | - | බර්තලොමි ටිමොනියර් |
| කාච | - | වෙනිස් (වින්සි) |
| අක්ෂි විදුරු | - | සැල්විනෝ |
| රූපවාහිනිය | - | බර්ඩ්, ජෝන් ලොගී |
| දුරකථනය | - | ග්‍රැහැම්බෙල් A |
| පරිගණකය | - | චාල්ස් බාබේජ් |
| ජංගම දුරකථනය | - | මාටින් කූපර් |
| SD කාඩ් | - | රොලඩ් මොරිනෝ |
| සීනය | - | ගුලිමර් |
| වානේ | - | හෙන්රි බෙස්මර් |
| සිමෙන්ති | - | ජෝසප් ඇස්පඩින් |
| ටයිල | - | ජර්මන් මිෂනාරීස් |
| වැසිකිළිය | - | තෝමස් කාපර් |
| කලිසම | - | ජෝර්ජ් බ්‍රයොන් |
| කමිසය | - | බියොහන්ස් |
| ඩෙනිම | - | ජේකොබ් ඩේවිස් |
| බ්‍රා එක | - | මැරික් වූකොක් |
| ක්‍රිකට් | - | W.J. ග්‍රේස් |
| වොලිබෝල් | - | මෝගන් විල්සන් |
| පාපන්දු | - | රොබට් කෝත් |
| පෙනිසිලින් | - | A.ෆ්ලෙමින් |
| ප්ලාස්ටික් සැත්කම | - | ආචිබල්ඩ් හෙක්ටර් M. |
| පෝලියෝ | - | ජොනස් සැල්ක් |
| වසූරියට | - | එඩ්වඩ් ජෙනර් |
| එක්ස්රේ | - | විල්හෙල්ම් රන්ජන් |
| ඉන්සියුලින් | - | ෆ්‍රෙඩ්රික් බැන්ටින් චාල්ස් H.බෙස්ට් |
| Quinine | - | පියරා ජෝසෙ |
| Stent Heart | - | ජූලියෝ පැල්මාස් |
| ප්ලාස්ටර් | - | පෝල් බෙයර්ස්ඩෝෆ් |
| නිර්වින්දක | - | විලියම් මෝර්ටන් |
| Anthrox | - | ලුවිස් පාස්චර් |
| විෂබීජ නාශක | - | ජෝසප් ලිස්ටර් |
| කෘතිම හදවත | - | ඩෙන්ටෝන් කූලේ |
| කෘතිම උකුල | - | ජෝන් චාන්ලේ |
| සම | - | ජෝන් එෆ්. ලෙන්ගිස් |
| උපත් පාලන පෙති | - | ග්‍රෙගරි පින්කස්. මින් චර්ච්. |
| රුධිර පාරවිලයනය | - | තෝමස් බ්ලන්ඩෙල් |
| ස්පර්ශ කාචය | - | ඇඩෝල්ෆ් ෆික් |
| කැස්ස සිරප් | - | ජේම්ස් ස්මිත් |
| සිරින්ජය | - | කොලින් මර්ඩොක් |

මෙම සත්‍යතාවය ප්‍රකාශ කිරීමට හේතු වූයේ බොහෝ අය පවසන ආකාරයට මේ ලෝකයට කිතුනුවන් කිසිවක් කර නැතැයි කියන බැවිනි. සියලු දෙනාම දැනගත යුතු සත්‍යතාවය නම්: මෙම සියලුම සොයා ගැනීම් ලෝකයට හඳුන්වා දෙනු ලැබුවේ කවුද? කියාය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ බලය කරනකොට ගෙන මෙම පුද්ගලයින් මේ ලෝකයට මෙවැනි දේ හඳුන්වාදීම පිළිබඳව සෑම කෙනෙකුගේම ඇස් විවර විය යුතුය.

NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Qualification : 10th Standard & above
Rush for admission! Medium :Tamil (Part Time)
Hindi (Residential) (Sponsorship Available)
Diploma in Theology
Recognised by International Christian Leaders & Senior Pastors for the past 56 years
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## "...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

### ස්වාමින්වහන්සේව විශ්වාස කරන්නවූ අයට උන්වහන්සේගේ අනුග්‍රහය තිබේ !

නමුත් ස්වාමීන් කෙරෙහි විශ්වාස කරන තැනැත්තේ කරුණාවෙන් වට කරනු ලබන්නේය." (ගීතාවලිය 32:10)

මගේ ජිවිතයේ කුඩා කාලයේ සිට අද දක්වා හොඳ කාලයන් සහ නරක කාලයන්ද තවත් බොහෝ විවිධ අත්දැකීම් තුලින්ද මට යන්නට ලැබුණි. නමුත් ඒ සියලු දේ තුලින් මට මතක් වන්නේ සර්වබලධාරි දෙවියන් වහන්සේ මා සමග සිටිමින් උන්වහන්සේ මගේ ජිවිතය තුළ මහත් වූ දේ සිදුවීමට උන්වහන්සේ මාව ඒ තුලින් සූදානම් කරමින් පැමිණි බවයි.

මා උන්වහන්සේ උදෙසා කරන්නාවූ සුභාරංචි සේවයට උපකාර කරන්නය කියා බොහෝ අය ලඟින් සිටි නමුත් කිසිවෙක් මා සමඟ එයට එකතු වූයේ නැත. නමුත් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නිසා උන්වහන්සේ මාව ඉදිරියට ගෙන ආවේය. මා හට එතරම් අත්දැකීමක් නොමැති වුවත් සේවය උදෙසාද එතරම් අත්දැකීමක් නොමැති වුවත් මගේ හදවත තුල මනුෂ්‍යයන්ට උපකාර කරන්න ඕනෑය කියන මහත් බරක් තිබුණි.

මා ඉතාමත්ම අමාරුවෙන් එකෝඩියම් නැමැති සංගීත භාණ්ඩය මිලදී ගත්තේය. එම කාල වකවානුව තුළදී මෙම සංගීත භාණ්ඩය ඉතදීය මුදලින් රුපියල් 750කි. මා එම සංගීත භාණ්ඩය වාදනය කරමින් හා ගීතිකා ගායනා කරමින් දුප්පත් මිනිසුන් ළඟට ගොස් සුභාරංචිය ප්‍රකාශ කළෙමි . ඉතාම ආශ්චර්ය දේ නම් මා මෙලෙස ශුභාරංචිය ප්‍රකාශ කළ ස්ථානයෙහි අද අපගේ ප්‍රධාන සභාව සහ කාර්යාලය පිහිටා තිබේ. ඒ කාලයේදී මා රාජ්‍ය සේවයෙහි යෙදී සිටි වේපාක් යන ස්ථානයේ විදි වල මා දේශනා කළෙමි. මෙහිදී සමහරු මාව විහිළුවට ගණන් ගත් නමුත් සමහරුන් මා පවසන දේ ඇසීමට පැමිණුනේය.

මා මෙලෙස විදි වල දේශනා කරන විටදී නිවෙස් තුළ සිටි මිනිසුන් එහි සිටි රෝගීන් මා වෙතට ගෙන ආවේය. යාඥාවෙන් පසුව ඔවුන් සුවය ලැබුවේය. තවත් සමහරු යක්ෂ ආත්මවලින් නිදහස ලැබුවේය. තවත් අය ක්ලාන්තය දමා වැටුණේය. යාච්ඤා කිරීමට බොහෝ අය පෝලිම්වල සිට පැමිණුනේය. මට මෙවැනි සේවයක් කිරීමට තරම් නිසි පුහුණුවක් තිබුණේ නැත. නමුත් මා දන්නා ආකාරයෙන් ඔවුන්ට සේවය කළෙමි.

ශුද්ධාත්මයාණන් වහන්සේ මිනිසුන්ට අත තබා යාච්ඤා කිරීමට මා හට මග පෙන්නුවේය. මා යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමෙන් යාච්ඤා කළ විට ඔවුන්ට සුවය ලැබුණේය. අඳුරු බලවේගයෙන්ගෙන් ඔවුන් නිදහස් විය. මෙවැනි අත්දැකීම් නිසා ක්‍රිස්තුස්වහන්සේ තුළ තිබූ ප්‍රේමය මා තුළ තව තවත් වැඩි වන්නට විය.

අද බොහෝ වසර ගණනාවකට පසු ඒ සෙනඟ අතරින් කීපදෙනෙක් අපගේ සභාවට පැමිණෙති. තවත් කීප දෙනෙක් සේවයේ යෙදී සිටිති. පසුව දෙවියන් වහන්සේ මාව විශාල සුභාරංචි රැස්වීම් පැවැත්වීමටත් බොහෝ හාස්කම් හා අඩයාලම් තුලින් උන්වහන්සේගේ වචනය ස්ථිර කළේය. තවමත් උන්වහන්සේගේ කරුණාව මා සමග තබමින් උන්වහන්සේගේ සේවය සඳහා මාව පාවිච්චි කරයි.

වසර කීපයකට පෙර කාංචිපුරම් නගරයේදී මට සුභාරංචි රැස්වීම් මාලාවක් පැවැත්වීමට ඉඩ ප්‍රස්ථාව ලැබුණේය. එහිදී දෙවියන්වහන්සේ මා තුලින් මහත් පුදුම දේවල් කළේය. ආරම්භය ඇරඹෙන්නේ ඉතා කුඩා ආකාරයෙන්ය. උන්වහන්සේගේ කරුණාව මා සමග තිබෙන නිසා බොහෝ විශාල දේ කිරීමට උන්වහන්සේ මාව පාවිච්චි කරයි. සියලු ගෞරවය හා මහිමය උන්වහන්සේගේ ශුද්ධ නාමයටයි!

*************

....Contd. from page 6

කන්න දුන්නේය. එසේම ඔහුට විවේක ගැනීමට ඉඩ ප්‍රස්ථාව සලසා දුන්නේය. අදත් උන්වහන්සේ අපටද එම දේම කරන බව පවසයි:

''වෙහෙස වෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි, මා වෙතට වරෙල්ලා, මම නුඹලාට සහනය දෙමි." (මතෙව් 11.28) උන්වහන්සේගේ අභිමුඛත්වයෙහි විවේක ගන්න. උන්වහන්සේ ඔබගේ සවිය අලුත් කරයි. දෙවියන්වහන්සේ අපට විවේකයේ පොරොන්දුව දී තිබේ .....

''..... මම නුඹ සමග ගොස් නුඹට නිවාඩු දෙන්නෙමි, කී සේක." (නික්මයාම 33:14) යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපට සැබෑ විවේකයක් දීමට පොරොන්දු වී ඇත. ''........මා වෙතට එන්න .... මාගේ වියගහ පහසුය. මාගේ බරද සැහැල්ලුය." (මතෙව් 11:28-30)

## MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikaans.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Theological Correspondence Courses: English & Tamil
5. Nehemiah Bible Colleges (Chepauk, Santhoshapuram & Velachery)
6. Branch Churches: Santhoshapuram, Balaji Nagar & Velachery
7. Great Commission Partners (Network of Pastors)
8. Training Programmes – Seminars & Retreats
9. Crusades
10. Literature Distribution and Follow Up
11. Gospel Printing Press - Publications
12. St. Paul's Matriculation School - Village English High School
13. Sunday Schools (Chepauk) : 10.30 a.m. Sunday & (Velachery, Balaji Nagar & Santhoshapuram) 3.00 p.m. Sunday
14. **Early Morning Service : 5.30 a.m. Sunday**
15. **Preliminary Service : 8.00 a.m. Sunday**
16. **Tamil Service : 8.30 a.m. Sunday**
17. **Youth Meeting : 11.00 a.m. Sunday**
18. **Fellowship Lunch : 1.00 p.m. Sunday**
19. **Telugu Service : 4.00 p.m. Sunday**
20. **Hindi Service : 5.00 p.m. Sunday**
21. **Tamil & English Service : 6.00 p.m. Sunday**
22. Feedback Time : 7.30 p.m. Sunday
23. Women's Prayer : 5.30 p.m. Wednesday
24. Hindi Prayer : 7.00 p.m. Wednesday
25. Men's Prayer : 7.30 p.m. Friday
26. Discipleship Meeting : 6.00 p.m. Saturday
27. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
28. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
29. Ministers' Meeting : 5.30 p.m. First Saturday
30. Parents' Prayer : 4.00 p.m. First Sunday
31. Night Prayer : 9.30 p.m. Third Friday
32. Fasting Prayer : 9:30 a.m. Second Saturday
33. Holy Communion : Second Sunday Service
34. Youth / Kid Prayer : 10.00 p.m. daily (over phone)
35. Staff Devotion : 9.00 a.m. daily
36. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

## පේතෘස් අපිට මතක් කර දෙයි !

“උන්වහන්සේ නුඹලා ගැන සලකන බැවින් නුඹලාගේ හැම කරදර උන්වහන්සේ පිට තබාපල්ලා.” (1පේත්‍රුස් 5:7) 'මා පිට තබන්න' යන වචනයට මා ඉතා කැමැත්තෙමි. එනම්, අප අපගේ බර උසුලන්නෙන් නැතිව සෑම දේම දෙවියන් වහන්සේගේ හස්තයට භාර දෙන්න යනුවෙනි.

“එවිට උන්වහන්සේ: නුඹලා පමණක් වනාන්තර ස්ථානයකට ඇවිත් ටිකක් පහසු ගනිල්ලා යයි ඔවුන්ට කී සේක ......” (මාර්ක් 6:31)

යේසුස්වහන්සේ සමාදානයේ කුමාරයාය. උන්වහන්සේ මෙලොවට පැමිණ අප උදෙසා උන්වහන්සේගේ ජීවිතය පුද කරමින් නැවත තුන්වන දින මළවුන්ගෙන් නැගිට්ටේය. එසේ කලේ උන්වහන්සේගේ සමාදානය අපට දෙමින් අප උන්වහන්සේගේ නිවාඩුව තුළින් ප්‍රීතිමත්ව සතුටු වෙන පිණිසය. අදම ස්වාමීන් වහන්සේව විශ්වාස කරන්න.

## අවසාන මතක් කිරීමයි!

*යේසුස් මෙන් මිතුරෙක් ඇත්ද*
*පාප බර දරන්නට*
*කීම මෙන් සැපතක් ඇත්ද*

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

**NOTICE**

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones. - Editor

*සියල්ල දෙවිඳුන්ට .....*
*ඕනෑ නැති දුක් බෝ කල ගත්තෙමුව සිතට*
*ඒ නොකී නිසයි සියල්ල*
*යාච්ඤාවෙන් සමිඳුන්ට..!*



".....මම නුඹ සමඟ ගොස් නුඹට නිවාඩු දෙන්නෙමි දෙන්නේමියි....." (නික්මයාම 33:14)

දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය ඔබ ඉදිරියෙන් යන සේක - ඔබට උන්වහන්සේ නිවාඩු දෙන සේක.

*ස්වාමීන්වහන්සේව විශ්වාස කරන්න.*
*සෑම දේම දෙවියන් වහන්සේට භාරදෙන්න.*
*උන්වහන්සේට කතා කරන්න.*
*උන්වහන්සේ නොමිලයේ දෙන්නා වූ නිවාඩුව ලබාගන්න.*

*************

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :
ECHO OF HIS CALL
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS Patrika Channel"**
**on 2nd MARCH 2026.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

## JESUS LOVES YOU!

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**